# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

ඩී. අනුර බණ්ඩාර ආරියරත්න
ඔත්තපහුව,
නැගම්පහ

<u>අභියාචක</u>

**අභියාචනා අංකය :**
**RTIC Appeal/883/2022**

එදිරිව

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
4 වන මහල
සෙත්සිරිපාය
බත්තරමුල්ල

<u>පොදු අධිකාරිය</u>

**ඉදිරිපිටදී** : 1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
3. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
4. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්
5. ඒ.එම් නහියා - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක සූම් තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වේ.
පොදු අධිකාරිය වෙනුවෙන් පෙනී සිටීමක් නැත.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නැත.
පොදු අධිකාරිය - ඉදිරිපත් කර නැත.

**විභාග කළ දිනය** : 2022.12.01

**තීරණය කළ දිනය** : 2022.12.01

**<u>කොමිෂන් සභාවේ තීරණය:</u>**

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2022.02.21 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

i. " කොවිඩ් වසංගත තත්වය හමුවේ පීඩාවට පත්වන ලද ජනතාව වෙනුවෙන් සමාජ ප්‍රතිලාභ යටතේ රු. 5000/- ක දීමනාව ගෙවීම් සඳහා එක් එක් අදියරය යටතේ වෙන් වෙන් වශයෙන් සමෘද්ධි ප්‍රජා මූල බැංකු වෙත යොමු කරන ලද අරමුදල් ප්‍රමාණයන් කොපමණද?

ii. එම එක් එක් අදියරයන්හි දී සත්‍ය වශයෙන්ම ගෙවීම් කරන ලද මුදල් ප්‍රමාණයන් හා ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව පිළිබඳව සියළු සමෘද්ධි ප්‍රජා මූල බැංකු මට්ටමින් ලේඛනයක් ලබා ගැනීම.

iii. කොවිඩ් සමාජ ප්‍රතිලාභ ගෙවීම් සඳහා ලංකා බැංකුව හා මහජන බැංකුව ඇතුළු මූල්‍ය ආයතනය මඟින් දෙපාර්තමේන්තු හා සමෘද්ධි ප්‍රජා මූල බැංකු ස්ථාවර තැන්පත් මුදල් සුරකුම් ලෙස තබමින් ලබා ගන්නා ලද ණය මුදල් ප්‍රමාණයන්, ලබාගත් ආයතන, ලබාගත් දිනයන්, කුමන අදියරයන් සඳහා ද වශයෙන් සවිස්තර වාර්තාවක් ලබා ගැනීම.

iv. ප්‍රතිපූර්ණ පදනම මත දෙපාර්තමේන්තු අනිවාර්ය ඉතිරි කිරීම් හා අනෙකුත් අරමුදල් මඟින් උක්ත වැඩසටහන සඳහා වැය කරන ලද අරමුදල් ප්‍රමාණයන්, වැය කළ දිනයන්, කුමන අරමුදලකින් ද යනවග පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබා ගැනීම.

v. එම වැඩසටහන සඳහා බැංකු හා මූල්‍ය ආයතන වෙතින් ලබාගත් ණය මුදල් ගෙවීම සඳහා භාණ්ඩාගාරය මඟින් මේ දක්වා ලැබී ඇති මූල්‍ය පහසුකම් ප්‍රමාණය හා ලද දිනයන්, මේ දක්වා ගෙවා ඇති ණය වාරික හා පොලී වාරික පිළිබඳ තොරතුරු, තවදුරටත් එම ආයතනය වෙත ගෙවීමට ඉතිරිව ඇති ණය ශේෂයන් පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබා ගැනීම. සමෘද්ධි ප්‍රජා මූල බැංකු ස්ථාවරය තැන්පත් ඇප සුරකුම නිදහස් කර ඇත්නම් ඒ සඳහා අදාළ මූල්‍ය ආයතන හෝ අධ්‍යක්ෂ ජනරාල්තුමා ලබා දෙන දැනුම්දීමේ ලිපියේ පිටපතක් ලබා ගැනීම.

vi. ප්‍රතිපූර්ණ පදනම මත වැය කර ඇති දෙපාර්තමේන්තු ගත අරමුදල් වලින් මේ වන විට රජය මඟින් නැවත ලබා දී ඇති අරමුදල් ප්‍රමාණයන්, ලද දිනයන් හා තවදුරටත් ලැබීමට ඇති අරමුදල් ප්‍රමාණය ඇතුළත් සවිස්තර වාර්තාවක් ලබා ගැනීම."

තොරතුරු නිලධාරියා විසින් පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2022.03.18 දිනැතිව නම්කළ නිළධාරියා වෙත අභියාචනයක් යොමු කර ඇත.

කෙසේවූවද,තොරතුරු නිළධාරී විසින් 2022.03.30 දිනැතිව අභියාචකගේ තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් පහත පරිදි ප්‍රතිචාර දක්වා ඇත.

"....අදාළ අයදුම්පත්‍රය මඟින් ඔබ විසින් ඉල්ලා ඇති පහත සඳහන් තොරතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

I. සමෘද්ධි ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු

II. සහනාධාර සඳහා මාසිකව වැය කරන ලද අරමුදල් පිළිබඳ තොරතුරු."

උක්ත ප්‍රතිචාරයෙන් සහ නම්කළ නිළධාරියා විසින් පනතේ දක්වා ඇති නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීමෙන් අතෘප්තියට පත් අභියාචක 2022.06.05 දිනැතිව කොමිෂන් සභාව වෙත මෙම අභියාචනය යොමු කර ඇත.

## සළකා බැලීම

ඉහත සඳහන් තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් තොරතුරු නිලධාරී ප්‍රතිචාර දක්වා ඇති බවට ලේඛන ඉදිරිපත්ව ඇතත්, තොරතුරු නිලධාරීගේ එකී ප්‍රතිචාරය තොරතුරු ඉල්ලීමට ගැළපෙන බවක් නොපෙනේ. අභියාචක විසින් නම් කළ නිලධාරී වෙත යොමු කළ අභියාචනයට ප්‍රතිචාර දැක්වීමක් සිදු වී නොමැත.

තොරතුරු ඉල්ලීමෙන් ඉල්ලා ඇති තොරතුරු කිසිවක් පනතේ 5 වන වගන්තිය යටතේ ලබා දිය නොහැකි තොරතුරු බවට ස්ථාවරයක් පොදු අධිකාරිය ගොඩනගා නැත. එබැවින් අභියාචක විසින් ඉල්ලා ඇති සියලුම තොරතුරු පොදු අධිකාරිය විසින් මුදා හැරිය හැකි තොරතුරු බවට පැහැදිලිව පෙනී යයි.
එබැවින් ඉහත කරුණු සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමෙන් දැක්වෙන සියලුම තොරතුරු 2022.12.31 දිනට ප්‍රථම, කොමිෂන් සභාවටද පිටපත් සහිතව අභියාචක වෙත මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට තීරණය කරමු.

කොමිෂන් සභාවේ මෙම තීරණයට අනුකූලව ක්‍රියා කිරීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම්, තොරතුරු නිලධාරිට සහ පොදු අධිකාරියට එරෙහිව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව නියමිත මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු පැවරීමට ක්‍රියාකළ යුතු බවට තීරණය කරමු.

එසේම, "2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රීති (ගාස්තු සහ අභියාචනා කාර්ය පටිපාටිය)" රීති මාලාවේ 11 වන රීතිය යටතේ උක්ත තොරතුරු මුදා හැරීමේදී පොදු අධිකාරියට ගාස්තු අය කිරීමේ හැකියාව නොලැබෙන බවද මෙහිලා වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමු.

කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය වෙත, තොරතුරු නිලධාරි වෙත සහ අභියාචක වෙත දන්වා යැවීමට කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහෙයවනු ලැබේ.

මෙම අභියාචනය අවසන් කරනු ලැබේ.